# ගොවි දිවියට ආලෝකය ගෙනෙන
# අලුත් සහල් මංගල්‍යය

**නෝමන් සිරිපාල**
**හිටපු ප්‍රචාරක නිලධාරී**
**ගොවිජන සේවා දෙපාර්තමේන්තුව**

**ගොවි ජනතාව කෙත හා බැත පිළිබඳ ඇති සියළුම සුබ අවස්ථා වල දී පුද පූජා පැවැත් වූහ. එමඟින් ගොවිතැනේ ආරක්ෂාව හා සශ්‍රීකත්වය අපේක්ෂා කළහ. ක්‍රි.පූ. පන්දහසකට වඩා පෙර පැවැති මොහෙන්දො ජාරෝ - හරප්පා ශිෂ්ටාචාර යුග වලදී ද, මිනිසා "ජගත් මාතා වන්දනාව" පැවැත්වූයේ ගොවිතැනේ සශ්‍රීකත්වය හා සෞභාග්‍යය අපේක්ෂාවෙනි.**

මහින්දාගමනයෙන් පසු බුදු දහම විසින් හික්මවනු ලැබූ ගොවි ජනතාව, කෙත හා බැඳී සියළුම අවස්ථා වල දී විශේෂයෙන් පුද පූජා පැවැත්වූහ. බුදුගුණ සිහි කළහ. එය ගොවි ජනතාවගේ ආචාර ධර්ම පද්ධතියේ විශේෂ අංගයක් බවට පත් විය.

අස්වනු නෙලාගත් විගසම ඉන් කොටසක් දන් දීමට පෙළඹුනේ මේ අයුරිනි.

“ පහක් පමණ බෙර තවත්     තිබෙනවා
තුනක් මැතල ගෙන අටුවෙ     තියනවා
දෙකක් කොටා කෑමට     සලසනවා
දනක් ද දීමට බතක්     උයනවා”

කුරහන් කපන විට වුව ද දානය සිහිවිය.

“ නැනො නැනො අපි දෙන්නා සමඟි     වෙමු
වානෙන් තැනූ පං කැති සාදවා     ගමු
හේනේ ගොසින් රවුමක් කුරහන්     කපමු
දානේ දෙන්න කුරහන් රොටි අරන්     යමූ”

එක් වගා කන්නයක් තුළ දී පස් වරක් හා තවත් වගා කන්නයක දී නව වරක් **“අගහසු”** දන් පූජා කිරීමට පැරැණි දඹදිව ගොවි ජනතාව දැක් වූ උතුම් පුද සිරිත, මහින්දාගමනය සමඟ හෙළ ගොවි ජනතාව අතර ද පුද සිරිතක් සේ මුල් බැස ගත්තේය.

දැඩි වෙහෙස මහන්සියෙන් ගොවිතැන් කොට ලබාගත් තම කෙතේ අග්‍ර ඵලයෙන් පිසූ කිරි බත (අග්‍රභක්තය - අක්බත) රස කැවිලි සමඟ තමනුත් ඉඳුල් කිරීමට පෙර, බුදුන් හා දෙවියන් නොපුදා අනුභව නොකෙරුණි.

“ තිති බත් දීමය මට බැරි     වන්නේ
අදවත් රසකර උයලා     දෙන්නේ
කිරිබත් සමඟින් කැවිලි     සදන්නේ
කවදත් මෙලෙසට අපි දන්     දෙන්නේ ”

සුබ දිනෙක, සුබ නැකතකින් කැපූ, රන්වන් ගොයමෙන් කරල් බරක් ඇද, බැති සිතින් යුතුව, හිසමත තබා, තම ගෙට ගෙන ගොස් ඉතා පිරිසිදු ලෙස බැත වෙන්කොට, පිළියෙළ කරගත් නොඉඳුල් අග්‍ර සශ්‍යය, රාජ්‍ය නායකයන්ගේ ප්‍රධානත්වයෙන් අවුරුදු පතා විහාර හා දේවාලවල සිදුකරනු ලැබූ **අලුත් සහල් මංගල්‍යයට** පූජා කොට, කොටස්කරුවකු වීම සුවිශාල පුණ්‍ය කර්මයක් ලෙස පැරැණි ගොවියෝ සැලකූහ. **අලුත් සහල් මංගල්‍යය** පිළිබඳ විචිත්‍ර තොරතුරු සිංහල බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ තුළ බෙහෙවින් දක්නට ලැබේ.

දඹදෙණි යුගයේ දී ලියැවී ආ **ධර්මසේන මහා හිමියන්ගේ සද්ධර්ම රත්නාවලිය,** ගැමි හදවත -ට ඉතාම සමීපවන සේ, ගොවිජන ජීවිතයේ ක්‍රියාකාරකම් සහ සිතුම් - පැතුම් ආශ්‍රිතව අසන්නා රසවත් කළ, රස කතා ඇතුළත් බණ දහම් පොතකි. එහි **අගසව් වතේ** අලුත් සහල් මංගල්‍යයේ විසිතුර මෙසේ මැනවින් දැක්වෙයි.

හෙම්බා මහණෙනි, මේ අප බුදු වූ කපට එකානුවන කප විපස්සී නම් බුදු කෙනෙක් ලෝ පහළ වූහ. එකල මහා කාලය, චූලකාලයැ යි ප්‍රසිද්ධ වූ දෙබෑ කෙනෙක් මහා හැල් කෙතක් (සේනක්) වැපිර වූහ. ඉක්බිත්තෙන් එක් දවසක් චූල කාල නම් මලනුවෝ හැල් කෙතට ගොසින් හැල් බඩයක් තලා පියා කැවූය. ඒ හැල් බඩය ඉතාම පැණි රසයෙන් යුත් විය.

උග රස බලවත් හෙයින් මෙසේ වූ බලවත් රසය දනක් දීපුවොත් ඊට වඩනා තිවත් රසත් ලද හැක්කැයි බුදු පාමොක් සඟනට හැල් බඩ වළඳන්ට තිසී ලෙසක ඉදිකරවා - දන් දෙනු කැමැතිව බෑනක් කරා ගොසින් **බෑණන් වහන්ස** හැල්බඩ තළවා පියා බුදු පාමොක් මහ සඟනට තිසී කොට ඉදිකරවා දන් දෙම්හ යි කිවූ ය. බෑනෝ ද ඒ අසා හැල් බඩ තළවා දන් දීමත් ගිය දවස වූයෙත් නැත. එන දවස වන දෙයකුත් නොවෙයි. ගොයම් නොනසව, කියාලා මලණුවන් හැල් බඩ දන් දෙන්ටම තර හෙයින් එසේ වී නම් සේන බෙදා පියා මා සන්තක භාගයට අලෙවි නොකොට තොප සන්තක භාගයට කැමැත්තක් කරව යි කිවූය.

ඒ අසා **‘යහපතැ’** යි සේන බෙදා පියා බොහෝ අත් කැමියන් හැර ගෙන හැල් බඩ තළවා පියා

සැළවලට නගා පැනක් නුමුසු කිරෙත්ම පැසවා පැසෙන අවස්ථාවේ දී ගිතෙල් මී සකුරු බුදු පාමොක් සඟනට දන් දී වළදා අන්තයෙහි ස්වාමිනි, මා දුන් මේ අගහස් දන හැම දෙනාට පළමු නිවන් පුර වදනට හේතු වේවා යි පැතූහ. බුදුනුත් එසේම වන නියාව දැන **"එසේම වේවා"** යි වදාළ සේක. උඉ පෙරළාත් සේනට ගොසින් බඩ තලා ගත් සේන් කැබෙල්ල බලා හැල් කරල් මිටි කඩා බැන්දා සේ යහපත්ව පැසී සිටි සේන කැබැල්ල දැක දෙසූ කෙත් වත් කල් යතත් පින් කෙත් උදවු ව එන නියාව දැන මසුරු සිත් නමැති වල් කසළ නෙළා හැර පී හෙයින් දෝ එකද කරලකට හානි නැතිව යවක්ව පැසී සිටියේ යි සිතා ඒ ගොයම් නොදන තෙක් දුටු සතුටේ අගහස් බතක් දන් දුන්හ. දන දවසුත් බතක් දන් දුන්හ. උක් පිඩි කරන දවසත් දනක් දුන්හ. කඳු කරන දාත් දනක් දුන්හ. කළවිට ලන දාත් දනක් දුන්හ. වී මිරිකා රාසි කරන දාත් දනක් දුන්හ. අටුවේ ලන දාත් දනක් දුන්හ යි නව වාරයක නව අගහස් බතක් දුන්හ. නව වරම හැර ගත් දෙයෙහි අඩුවක් නැතිව කුසල් හි අදහසේ පිරෙන්නා සේ තද් වස්තුක වූ සශ්‍ය ඵලයක් අඩු නැති වේවයි ඒ නව අගහස් දන් දී එසේ පතා මෙයට ලක්ෂයක් වන කප පියමතුරු නම් බුදුන් සමයෙහිත් සතියක් මුළුල්ලෙහි ම මහ දන් දී එලෙසම පැතූහ.

"එසේ හෙයින් දැන් බණ කියා නිවන් දක්වන ගමනේත් උන් ම පළමු කොට නිවන් දක්වා ලිමි."

එසේම සද්ධර්මරත්නාවලියේ පංචවග්ගදායක බමුණාන්ගේ වස්තුවේ පස් අගකින් දුන් දන් පිළිබඳ විස්තරය මෙසේ වෙයි.

"ඒ බමුණානෝ ගොයම් කොට ජීවත් වන කෙණෙක. උඉ තුමූ ගොයම් දීම දී පෙරාතු අගහස් බතක් දෙති. කොළ කලවිටි දු කල අගහස් බතක් දෙති. කොළ මිරිකා වී රැස් කලත් අගහස් බතක් දෙති. තලියේ ලාදු කල කත්ට පෙරතු අගහස් බතක් දෙති. මෙලෙසින් කෙත අක්බතය (කෙතෙක් බතය) කලවිට අක් බතය, වී අක්බතය, සැළි අක්බතය, තළි අක්බතය' යි පස් අගතින් දන් දෙති. බත් කල වේලාවට පැමිණි කෙනෙකුන්ටත් නොදී අනුභව නොකෙරෙති. එහෙයින් පංචවග්ගදායකයෝය" යි නම් තබා ගත්හ.

නූතන අලුත් සහල් මංගල්‍යය ඉහත කී බොදු සිරිතෙන් උපත ලද පූජා මංගල්‍යයක් වූවා නිසැක ය.

ක්‍රි.පූ. තුන්වන සිය වස වන විට, ශ්‍රී ලංකාවේ බුද්ධාගම මුල් බැස ගෙන තිබුන ද, අති පුරාණ විෂ්ණු, ශිව හා හින්දු ආගමෙහි අත්‍යාවශ්‍ය අංගය වූ ප්‍රාණාත්මක දෘෂ්ටික ඇදහීලි ක්‍රම හා ඒ හා සම්බන්ධ වූ අභිචාර විධි (උපචාර විධි - යාතු කර්ම) අභාවයට නොගියේ වන මිනිසා සාමාන්‍යයෙන් අසුභවාදී දෙවියන් සහිත වූ විශාල සංඛ්‍යාවක ගේ බලපෑමෙන් වෙලී සිටි බැවිනි. එබැවින්, අසුභවාදී භූතයින් ගේ බලපෑම් වලක්වා ගැනීමට සුභවාදී දෙවියන්ගෙන් සහන සලසා ගනු පිණිස, මිනිසා විසින් කාලයක් තිස්සේ පුරුදු පුහුණු කරනු ලැබූ වත් පිළිවෙත් හා පූජා විධි රැසක් විය. බුදු දහම වඩා උසස් තත්ත්වයකට පත් වූ විට වුව ද, ප්‍රාණාත්මක දෘෂ්ටික ඇදහිලි ක්‍රම හා සම්බන්ධ වූ අභිචාර විධි අඛණ්ඩව පැවතියේය. සුභවාදී දෙවියන් හා අසුභ වාදී භූතයින් බෞද්ධ ලෝක විස්තරයෙහි ද යථා සත්‍යයක් වශයෙන් පිළිගැනුනෙන් එම සංකල්ප මිනිසා තුල බුදු සමය සමගම වෙලී පැවතිණි. දෛනික ජීවිතයේ දී ලෙඩක්, දුකක් වසංගතයක් හෝ වගා හානියක් වැනි විශේෂ ආපදාවකට ලක් වූ විට ඔවුහු ආරාමයේ භික්ෂූන් වහන්සේ ගේ සරණ ගැනීමට වඩා, දේවාලයේ කපු රාළලා ගේ පිහිට පැතීමට පුරුදු වූහ. දැන් බොහෝ දෙනා ඒ සියල්ල හැර දමා බෝධි පූජාවට පිවිස සිටිති.

බුදු දහමේ බලපෑමෙන් ගොවිජන ජීවිතය තුල මුල් බැස ගත් අලුත් සහල් මංගල්‍යය කල් යත්ම ක්‍රමයෙන් රාජ්‍ය අනුග්‍රහය ලත් පූජා මංගල්‍යයක් බවට පත් විය. ගොවි ජනතාව ගේ උදාර පූජා සිරිතට රජතුමාගේ ද සහභාගීත්වය අත්‍යාවශ්‍ය බව පිළිගැණුනි.

එවකට භූමියේ අයිතිය රජු සතුව පැවැතියෙන් රජතුමා **භූපති** නමින් ද හැඳින්විනි. රජතුමා දෙවියන් විසින් පහළ කරනු ලැබූ හා දෙවියන්ට ප්‍රිය වූ (දේවානම් පිය) කෙනෙක් සේ සලකනු ලැබිය. භූමිය හෙවත් **මිහිකත** ද දේවත්වයෙන් සැළකිණි. භූමියෙන් ලැබෙන අග්‍රඵලයේ හිමිකරු රජතුමා වූයෙන්, ඉන් පුද කෙරෙන **අලුත් සහල් මංගල්‍යයට** රාජ්‍ය අනුග්‍රහය ලැබුණේය.

දේවානම් පියතිස්ස රජතුමා විසින් අනුරාධපුරයේ කරවනු ලැබූ කෙතකින් ලැබුණු සහලින් කිරිහර පූජාවක් පැවැත් වූ බව **සයංජාත මාලය** නමැති පද්‍ය ග්‍රන්ථයේ සඳහන් වේ.

" මහ රජ මෙ බසට කර සිත පළමුව
සහ යුතු මැති සැම මේ බස සදමුව
මහ මෙ පිනෙන් අපි මොක් සැප ලබමුව
මහ කිරිහර පූජාවක් කරමුව'

මෙම කිරිහර පූජාව පවත්වන්නට ඇත්තේ අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් මහන්සේට විය හැකිය.

ක්‍රි.පූ. අන්තිම සියවසේ දී **මහාචූල මහා තිස්ස රජතුමා** වෙස්වලාගෙන ගොස් ගොයම් කැපීමේ යෙදී සිට ලබාගත් කුලියෙන් භික්ෂූන් වහන්සේ නමකට දානයක් වශයෙන් ආහාර දුන් බව මහා වංශයේ සඳහන් වේ. මහා වංශයෙන් තවත් එවැනි තොරතුරු ලැබේ. දෙවන සියවසේ දී **වසභ රජතුමා** රෝහණ රාජ්‍යයෙහි ආරාමයකට කරිස (කිරිය - අමුණු සතරකි) 1018 ක ඉඩමක් පූජා කළේය. පස්වැනි සියවසේ දී **ධාතුසේන රජතුමා** අමුණු දහයක් වූ කුඹුරක අස්වැන්නේ නොකඩවා දන් වැටක් පැවැත්වීම ආරම්භ කළේය. හයවන සියවසේ දී **මහා නාග රජු** විසින් කෙත් 1100 ක් විහාරාරාම වලට පූජා කරන ලදී. **1 වැනි අග්බෝ රජතුමා** කෙත් 100 ක්

පූජා කර තිබේ. මේ බුදු පුදට රාජ්‍ය අනුග්‍රහය නොමදව ලැබුණු සැටිය යි.

බෞද්ධ සංකල්පයකින් උපත ලද්දක් වුව ද, අලුත් සහල් මංගල්‍යය දෙවියන් උදෙසා කෙරෙන පූජා විධියක් ලෙස ද ව්‍යාප්ත විය. **ගම්පොළ** ඓතිහාසික අලුත් සහල් මංගල්‍යය දෙවියන් උදෙසා කෙරුණු පූජාවකි. **දඹුල්ලේ** අලුත් සහල් මංගල්‍යය දඹුල්ලේ විෂ්ණු - දේවාලය කේන්ද්‍රකොට ගෙන පැවැත්වේ. **තම්මැන්නා** ප්‍රදේශයේ **අඩුක්කු කංකාරිය** නමින් වූ අලුත් සහල් මංගල්‍යය දෙවියන් වෙනුවෙන් සිදු කෙරෙන පූජා මංගල්‍යයකි. බුද්ධ පූජාව පැවැත්වීමෙන් පසු විහාරයේ භික්ෂූන් වෙත අලුත් බත් දානය දීම සාමාන්‍ය පරිදි සිදුවූවත්, ප්‍රාදේශීය දෙවිවරුන් සේ සැලකෙන **වීරමුණ්ඩ, දැඩිමුණ්ඩ, කඩවර, අයියනායක** සහ **ගලේ බණ්ඩාර** යන දෙවිවරුන් සඳහා **අඩුක්කු කංකාරිය** මංගල්‍යයක් සේ පැවැත්වූහ. **දිගාමඩුල්ලේ** පැවැත්වෙන ගමට වෙන් වූ **මහාදාන මංගල්‍යය** වෙල්යායේ පැවැත්වෙන **කිරි ඉතුරුම් මංගල්‍යය** සහ වැව් කන්ඩියේ පැවැත්වෙන **මුට්ටි මංගල්‍යය** ද, දේවාශිර්වාදය අපේක්ෂා වෙන් පැවැත්වෙන අලුත් සහල් මංගල්‍යයන් ය. මහියංගනයේ සමන් මහා දේවාලයේ අලුත් සහල් මංගල්‍යය සමන් දෙවියන් සඳහා වූ විශේෂ පූජාවකි.

**ගම්පොළ යුගය වන විට ශේෂව පැවැති සිංහලයන් ගේ සතර මහා මංගල්‍යය අතුරින් ප්‍රධාන එකක් බවට පත්වන තරම් වූ සුවිශේෂ මංගල්‍යයක් ලෙස අලුත් සහල් මංගල්‍යය ගොවිජන ජීවිතය තුළ හා බොදු හදවත් තුළ ජීවනය ලබා පැවත ආ වග පෙනෙයි.** ක්‍රි.ව. 1500 න් ඇරඹි අවුරුදු 450 ක් පමණ ගෙවී ගිය බටහිර ජාතීන්ගේ පාලන සමය තුළ දී හෙළ බොදු සිරිත් ක්‍රමයෙන් අභාවයට ගිය ද, නිදහසින් පසු හෙළ බොදු ගොවි සිරිත් යළි පණ ලබන්නට විය.

පාරම්පරික ගොවියා කමතේ දී ගොයම් මැඩවීම ආරම්භ කළේ පළමුව දානේ දෙන අදහස සිතේ රඳවා ගෙනය.

“ වැඩවුන් ගෞතම මුනිඳුන් සහ වෙත
පුදන ලෙසින් පළමුව දානේ
දැහැමින් ලැබූ දෙය තමයි මහත් පල
දීමෙන් සිල්වත් හට දානේ
යහමින් වැඩිපුර වෙහෙස උනත් හරි සත්මස
පසුකර ගිය දානේ
වැඩවුන් මෙලෙසට පටන් ගනිමු අපි
සිතින් ඉටාගෙන දෙන දානේ”

**මැඩවූමෙන් පසු කමතේ දී, පළමුව වී කුරුණිය මැන වෙන් කළේ බුදුන් වෙනුවෙනි.** එසේ බුදුන් වෙනුවෙන් මැන වෙන් කල, වී කුරුණිය මුල්යාල (අක්යාල - අක්කියල්ලාහ) නමින් හැඳින් වේ. ඉන්පසු, ගෙදර ගෙන එනු ලබන වී වලින් අලුත් සහල් පිළියෙල කොට අලුත් බත් පිස බුදුන් හා දෙවියන් පුදා පසුව ඉඳුල් කරනු ලබයි.

අලුත් සහල් මංගල්‍යයේ දී අලුත් ආහාර බුදුන්ට පූජා කිරීමෙන් අනතුරුව, පසු දිනෙක නැකත් විමසා අලුත් බත් ඉඳුල් කළ බව **පුරාණ ගොයම් මාලය** නමැති කාව්‍ය සංග්‍රහයේ එන පහත දැක්වෙන පද්‍ය වලින් පැහැදිලි වේ.

“ ලොව්තුරු මුනිඳුගෙ අනය මුලුල්ලේ
සිව්වර දෙවියන් සහ මෙසියල්ලේ
සව් සත රකිනා උපතකි ඉල්ලේ
සව්සිරි වෙයි අලු සල් මංගල්ලේ

සිලුත් රකින පෝයත් සිදු කරලා
මලුත් අහර මුනිඳුට පුද කරලා
කලුත් බලා මොහොතක් විමසාලා
අලුත් බතුත් කති තම පසු ඉඳලා”

එක් එක් පවුලේ අය තනි තනිව ඉටු කළ මෙම පුද සිරිත ගමේ සියලුදෙනාම එක්වීමෙන් එකම දිනයක දී සිදු කිරීම නිසා එය මංගල්‍යයක් බවට පත්වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

තමන් විසින් අස්වද්දන ලද කෙතේ හෝ හේනේ අස්වැන්නෙන් දානයක් දී ගන්නට නොහැකි වන අවස්ථා වල දී, තම අස්වැන්න කපා පාගා තමා වෙනුවෙන් දානයක් දීමට වෙනත් කෙනෙකුට පවරනු ලැබූ අවස්ථා වුව ද හිඟ නොවීය.

“ කැලේ කොටාලා වල් ගිනි තියලා
පොලව සුද්ද කරලා වී වපුරාලා
මගේ ඇහෙන් ගිය දාඩිය බලලා
වෙසක් එකට දන් දීපල්ලා උඹලා”

රාජ්‍ය අනුග්‍රහය ඇතිව බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සිදුකල අලුත් සහල් මංගල්‍යය **අනුරාධපුර** ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස හා **මහනුවර** ශ්‍රී දළදා සම්දුන් අබියස දී පැවැත් වුණි. ප්‍රාදේශීය වශයෙන් ගම්පොළ, කතරගම - කිරිවෙහෙර, පොළොන්නරුව - ගල් විහාරය සහ කළුතර - බෝධීන් වහන්සේ අබියස පැවැත්වුණි.

බුද්ධ පූජාවක් සහ දේව පූජාවක් වශයෙන් ව්‍යාප්තව ගිය මෙම උතුම් ගොවි සිරිත ප්‍රසිද්ධ පූජනීය ස්ථාන වලට පමණක් සීමා නොවී, ඈත ගම්මාන වලට ද ව්‍යාප්ත වී යා යුතු විය. එමෙන්ම, බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් වැනි ආගමික පූජනීය ස්ථානයන් හි වගා කන්නයෙන් කන්නයට අලුත් සහල් මංගල්‍යය පැවැත්වීම ගොවි තැනට ආශිර්වාදයක් මෙන්ම ගොවි ජනතාවට ද ශාන්තියකි.

මෙම **ගොවි ජනතා** ප්‍රකාශනය සංස්කරණයේ දී නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ඩබ්.ජී. ජයසේන මහතාගෙන් ලැබුණ සහයෝගය ස්තුති පූර්වකව සටහන් කරමු.

- ***සංස්කාරක*** -